කඩුවෙල මහ නගර සභාව

கடுவெல மாநகர சபை

**Kaduwela Municipal Council**

නව නුවර පාර, කඩුවෙල  புதிய கண்டி வீதி, கடுவெல  New Kandy Road,Kaduwela

| දුරකථන අංකය<br>தொலை பேசி<br>Telephone | නගරාධිපති<br>முதல்வர்<br>Mayor<br>011-2539832 | නාගරික කොමසාරිස්<br>மாநகர ஆணையாளர்<br>Municipal Commissioner<br>011-2548491 | ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம<br>Head Office<br>011-2571200 | ක්ෂණික ඇමතුම්<br>உடனடி அழைப்புகள்<br>Hotline<br>011-2548999 | ෆැක්ස් பெக்ஸ் Fax - 011-2548492<br>ඊ මේල් மின்னஞ்சல் E-Mail<br>mckaduwela@gmail.com<br>www.kaduwela.mc.gov.lk |
|---|---|---|---|---|---|


| මගේ අංකය<br>எனது இலக்கம்<br>My Number | KMC/03/04/15/2025 | ඔබේ අංකය<br>உங்கள் இலக்கம்<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2025.11./24 |
|---|---|---|---|---|---|

Manager Ewis
No 142 Galle Rd
Colombo - 03

X 02 DEC 2025
RECEIVED

**<u>මුද්‍රණ යන්ත්‍ර වලට භාවිතා කරන ටොනර් සඳහා මිල ගණන් කැඳවීම - 2025</u>**

කඩුවෙල මහා නගර සභාවේ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ඇමුණුමේ සඳහන් මුද්‍රණ යන්ත්‍ර වලට භාවිතා කරන ටොනර් මිලදී ගැනීම සඳහා 2025.11.25 දින සිට 2025.12.08 වන දින ප.ව. 2.00 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

02. ඒ අනුව, මීට අමුණා ඇති ඇමුණුම 01 උප ලේඛනයේ සඳහන් මුද්‍රණ යන්ත්‍ර වලට භාවිතා කරන ටොනර් සඳහා පහත කොන්දේසිවලට යටත්ව ඔබගේ අවම මිල ගණන් 2025.12.08 දින ප.ව. 2.00 ට හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ එසේ නැතහොත් ඔබගේ මිල ගණන් කඩුවෙල මහා නගර සභාවේ නාගරික ගණකාධිකාරී නිල කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලිය හැක.

03. ටෙන්ඩර් මිල ගණන් එදින ප.ව. 2.00 ට විවෘත කරනු ලැබේ.

04. එම අවස්ථාවට ලංසු අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගීවීමට ඉඩදෙනු ලැබේ.

**මිල ගණන් කැඳවීමේ කොන්දේසි.**

1. මිලදී ගැනීමට අපේක්ෂා කරන ද්‍රව්‍ය පිළිබඳ උප ලේඛනයක් මීට අමුණා ඇති අතර, ඔබගේ මිල ගණන් එම උප ලේඛනයේම සඳහන්කර ඔබගේ අත්සන හා නිල මුද්‍රාව තබා ඉදිරිපත් කළ යුතු ය. සියළුම තොරතුරු සම්පූර්ණකර තිබිය යුතු අතර, එසේ නොවන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. තැපෑලේ දී අස්ථාන ගතවන හෝ නියමිත දිනට/ වේලාවට ටෙන්ඩර් පෙට්ටියට නොලැබෙන මිල ගණන් පිළිබඳ කඩුවෙල මහා නගර සභාව වගකියනු නොලැබේ. ප්‍රමාද වී ලැබෙන මිල ගණන් ප්‍ර තික්ෂේප කරනු ලැබේ.
3. තැපෑල මඟින් ඔබගේ මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම්, ලියුම් කවරයේ ඉදිරිපස වම් කෙළවරේ "**<u>මුද්‍රණ යන්ත්‍ර වලට භාවිතා කරන ටොනර් සඳහා මිල ගණන් කැඳවීම - 2025</u>**" යනුවෙන් සඳහන් කළ යුතු ය.
4. ඔබගේ මිල ගණන් පැහැදිලිව සඳහන් කළ යුතු අතර, මිල ගණන් සටහන් කිරීමෙන් පසු ඒවා වෙනස් කිරීමට සිදුවන අවස්ථා වෙතොත් ඒ ඉදිරියේ කෙටි අත්සන යෙදිය යුතු ය.
(මකන දියර යොදා සංඛ්‍යාවක් නොමැකිය යුතු ය.)
5. ඔබගේ මිල ගණන් ටෙන්ඩර් විවෘත කරනු ලබන දින සිට **මාස දොළහක් (12)ක්** සඳහා වලංගු විය යුතු ය.
6. ඔබ ආයතනය මෙම ද්‍රව්‍ය සැපයීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඇණවුම් කරනු ලබන ද්‍රව්‍ය ප්‍රධාන කාර්යාලයේ ගබඩාව වෙත ප්‍රවාහනය කර භාර දිය යුතු ය.
7. ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත. කැඳවනු ලබන ද්‍රව්‍ය අවස්ථා කිහිපයක දී ඇණවුම් කිරීමට සිදුවුවහොත් ඒ සඳහා එකඟතාවූ එල කළ යුතු ය.
8. අදාළ සෑම අයිතමයක් සඳහාම ප්‍රමිති සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය
9. මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍යවන්නේ නම් ප්‍රධාන කාර්යාලයේ නාගරික ගණකාධිකාරී ගෙන් දැනගත හැක.
(011 2539562)
10. අත්තිකාරම් මුදල් ගෙවනු නොලැබෙන අතර බිල්පත් ඉදිරිපත් කර පසු චෙක්පත් මගින් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ .
11. වැට්බදු ලියාපදිංචි සහතිකයේ ඡායාපිටපතක් මිල ගණන් සමඟ ඉදිරිපත් කල යුතුය.

එම්.දිනේෂ් එස්. පින්තු,
නාගරික ගණකාධිකාරී
නාගරික කොමසාරිස් වෙනුවට.

දුරකථන අංකය : 0112539562
ෆැක්ස් අංකය : 0112539562
විද්‍යුත් ලිපිනය : mfdkmc@gmail.com


| උප කාර්යාල<br>உப காரியாலயம்<br>Sub Office<br>දුරකථන අංකය தொலை பேசி Telephone<br>ෆැක්ස් பெக்ஸ் Fax | කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලය<br>கடுவெல மாவட்ட காரியாலயம்<br>Kaduwela District Office<br>011-2539839<br>011-2548492 | බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලය<br>பத்தரமுல்ல மாவட்ட காரியாலயம்<br>Bathtaramulla District Office<br>011-2867865<br>011-2867432 | අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලය<br>அதுருகிரிய மாவட்ட காரியாலயம்<br>Athurugiriya District Office<br>011-2561017<br>011-2053954 |
|---|---|---|---|